ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2022/01/20

පැමිණිලි පාර්ශවය : ආර්.විමලසිරි,
අංක : 12, නවසේනපුර,
සඳුන්පිටිය.

වගඋත්තර පාර්ශවය : 01. එස්.එම්.එල්.ආර්.බණ්ඩාර මහතා,
ස්ථානාධිපති,
පොලිස් ස්ථානය, වැලිකන්ද.

02. පො.සැ. 23339 ඒ.ආරියරත්න මහතා,
පොලිස් ස්ථානය, වැලිකන්ද.

03. පො.කො. 74585 එච්.ජී.ඩී.එස්.හේවගේ මහතා,
පොලිස් ස්ථානය, වැලිකන්ද.

04. සිවිල් ආරක්ෂක භට එම් 029113,
එච්.වානක ලක්ෂ්මන් කුමාර මහතා,
පොලිස් ස්ථානය, වැලිකන්ද.

පැමිණිලි අංකය : **HRC/AP/394/2018(I)**

**පැමිණිල්ලේ කරුණු දැක්වීම :**

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර සිටින්නේ, පැමිණිලිකරු තම බිරිඳ හා පුතා සමඟ ලඟ නිවසකට යමින් සිටියදී පොලිස් ජීප් රථයක් පැමිණ තමාට නවතින්න කියා කියූ බවත්, එවිට තමා ඇයි කියා විමසූ බවත්, එවිට කිසිදු හේතුවක් නොදන්වා තමාව ජීප් රථයට නංවාගත් බවත්, පසුව ජීප් රථය තුළදී පොලිස් නිලධාරියෙකු හා සිවිල් ආරක්ෂක නිලධාරියෙකු තමාට පහරදුන් බවත්ය.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :**

වැලිකන්ද පොලිස් ස්ථානයේ ස්ථානාධිපති විසින් පැමිණිල්ල සම්බන්ධයෙන් කරුණු දක්වමින් අංක OW/312/2019 හා 2019.01.21 දිනැති වාර්තාව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරමින් සඳහන් කර සිටින්නේ, බීමත්ව මවට බැණ වදිමින් කළහකාරි ලෙස හැසිරෙන පුද්ගලයෙකු සම්බන්ධයෙන් වැලිකන්ද පොලිස් ස්ථානයේ ස්ථානාධිපති වන තමා වෙත දූරකථන පණිවිඩයක් මඟින් තොරතුරු ලැබුනු බවත්, එම තොරතුර අනුව විමර්ශනයක් සිදු කළ බවත්, එහිදී මෙම පැමිණිලිකරු බීමත්ව කළහකාරී ලෙස හැසිරීමේ වරදට 2018.10.15 වන දින පැය 17.30 ට අත්අඩංගුවට ගත් බවත්ය.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / E-mail: sechrc@gmail.com
දුරකථන / தொலைபேசி: 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர்: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு: 1996
වෙබ් / இணையம்: www.hrcsl.lk

අත්අඩංගුවට පත් පැමිණිලිකරු බීමත්ව සිටි ඇති බවත්, ඔහුව පොලිස් ස්ථානය වෙත රැගෙන එන අවස්ථාවේදී ජීප් රථයේ සිටි සිවිල් ආරක්ෂක භට එම් 029113 වානක නිලධාරියාගේ අත සපා කා ඇති බවත්, ඒ අනුව එම සිවිල් ආරක්ෂක භටයා අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පෝරමයක් යොමු කර රෝහල් ගත කළ බවත්ය.

එමෙන්ම, මෙම පැමිණිලිකරු ද අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පෝරමයක් සමඟින් රෝහල්ගත කරන ලද බවත්, එම අයගේ ප්‍රකාශය රෝහලේ දී ලබාගන්නා ලද බවත්, ඔහු පොළොන්නරුව රෝහලේ පොලිස් ආරක්ෂාව යටතේ නේවාසිකව ප්‍රතිකාර ලබමින් සිටියදී මනම්පිටිය ම/උ බී 1681/18 යටතේ 2018.10.16 වන දින ගරු අධිකරණය වෙත ඉදිරිපත් කල බවත්ය.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමු කර ඇති පැමිණිල්ලේ පො.කො. 61740 පොලිස් නිලධාරියා විසින් පහරදීමක් සිදුකර ඇති බවට සඳහන් කර ඇතත්, මෙම නිලධාරියා එදින පොලිස් ස්ථානයේ අධිකරණ රාජකාරි කටයුතු වල යෙදී සිටි නිලධාරියෙකු බවත්, මෙම සිදුවීමට මෙම නිලධාරියාගේ කිසිදු සම්බන්ධතාවයක් නොමැති බවත් එම වාර්තාවේ වැඩිදුරටත් සඳහන් කර ඇත.

**වැටලීම භාරව කටයුතු කල නිලධාරින්ගේ ප්‍රකාශ :**

වැටලීමට සහභාගි වූ පො.සැ.23339 කේ.ආරියරත්න යන අය කොමිෂන් සභාවේ පැවති පරීක්ෂණයට සහභාගි වෙමින් සඳහන් කර ඇත්තේ, 2018.10.15 වන දින ජංගම සංචාරයේ යෙදුනු බවත්, තමා සමඟ පො.කො.74585 හේවගේ සහ සිවිල් ආරක්ෂක භට එම් 029113 වානක නිලධාරියා ද ඒ සඳහා එක්වූ බවත්ය. මෙම පැමිණිලිකරුගේ මව වන ජී.ගුණවතී යන අය විසින් කරන ලද පැමිණිල්ලක් අනුව ස්ථානාධිපතිතුමා විසින් තමා ඇතුළු කණ්ඩායමට පොලිස් ස්ථානය වෙත පැමිනෙන ලෙසට දැනුම් දුන් බවත්, ඒ අනුව පොලිස් ස්ථානය වෙත පැමිණි බවත්, ඒ අවස්ථාවේදී මෙම පැමිණිලිකරුගේ මව පොලිස් ස්ථානයේ සිටි බවත්, ඇය විසින් ඇයගේ පුතා බීමත්ව පහරදීම් සිදුකරන බව ස්ථානාධිපතිතුමා වෙත පැමිණිලි කර තිබූ බවත්ය. ඒ අනුව ජී.ගුණවතී යන අය සමඟ ගොස් එම පුද්ගලයා රැගෙන එන ලෙසට ස්ථානාධිපතිවරයා විසින් උපදෙස් දුන් බවත්, ඒ අනුව එම කාන්තාව සමඟ අදාළ ස්ථානය වෙත ගිය බවත්, එහි යනවිට මෙම පැමිණිලිකරු නිවසේ නොසිටි බවත්, පසුව ජී.ගුණවතී යන අයව නිවසේ රඳවා ආපසු පොලිස් ස්ථානය වෙත එමින් සිටියදී අතරමඟදී මෙම පැමිණිලිකරුව මුණගැසුනු බවත්, ඒ අනුව ඔහුව පොලිස් ස්ථානය වෙත රැගෙන පැමිණි බවත්ය.

එමෙන්ම, මෙම පැමිණිලිකරු විසින් සිවිල් ආරක්ෂක භට වානක යන අයගේ ඇඟිල්ල සපා කෑම මත සිදුවූ තුවාල සඳහා ප්‍රතිකාර ගැනීමට එම නිලධාරියා ද, මෙම පැමිණිලිකරුගේ බීමත්භාවය පරීක්ෂා කිරීම සඳහා පැමිණිලිකරු ද වැලිකන්ද රෝහල වෙත රැගෙන ගිය බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

පො.කො. 74585 එච්.ජී.ඩී.එස්.හේවගේ මහතා සහ සිවිල් ආරක්ෂක භට එම් 029113 එච්.වානක ලක්ෂ්මන් කුමාර යන නිලධාරින් කොමිෂන් සභාව ඉදිරියේ පෙනීසිටිමින් ප්‍රකාශ කර ඇත්තේ, 2018.10.15 දින පො.සැ. 23339 ආරියරත්න මහතා සමඟ මෙම වැටලීමට සහභාගි වූ බවත්, පො.සැ. 23339 ආරියරත්න මහතා විසින් ලබාදුන් උපදෙස් අනුව පැමිණිලිකාර ආර්.විමලරත්න යන අයට ජීප් රථයට ගොඩවන ලෙසට උපදෙස් ලබාදුන් බවත්, නමුත් ඔහු ඊට දිගින් දිගටම ප්‍රතිරෝධය දක්වමින් ජීප් රථයට ගොඩවීම ප්‍රතික්ෂේප කළ බවත්, ඒ අනුව පො.සැ. 23339 ආරියරත්න මහතාගේ උපදෙස් මත පැමිණිලිකරුව උස්සා ජීප් රථයට දැමූ බවත්, ඒ අවස්ථාවේදී ඔහු බීමත්ව සිටි බවත්, ඔහුව අත්අඩංගුවට ගැනීමට අදාළ වැටලීම සිදුවූයේ ද බීමත්ව කලහකාරි ලෙස හැසිරීම පිළිබඳව ඔහුගේ මව විසින් පොලිස් ස්ථානය වෙත සිදුකරන ලද පැමිණිල්ලකට අනුව බවත්ය.

වගඋත්තරකාර පො.කො. 74585 එච්.ජී.ඩී.එස්.හේවගේ මහතා පැමිණිල්ල සම්බන්ධයෙන් කරුණු දක්වමින් තවදුරටත් ප්‍රකාශ කර සිටින්නේ, මෙම පැමිණිලිකරු බීමත්ව කළහකාරී ලෙස හැසිරීම මත ජීප් රථයට නංවාගත් අවස්ථාවේදී ඔහු විසින් තමා භාරයේ තිබූ ගිනි අවිය උදුරාගෙන ඔහුගේ මවට වෙඩි තියන්න ඕනේ යැයි කියමින් ජීප් රථය තුළ කළහකාරී ලෙස හැසිරුනු බවත්, නමුත් තම ගිනි අවිය උදුරා ගැනීමට ඉඩ ලබානොදුන් බවත්, ඒ අවස්ථාවේදී සිවිල් ආරක්ෂක භට එම් 029113 වානක නිලධාරියා තමාට සහය වූ බවත්, ඒ අනුව තමන් දෙදෙනා එකතු වී අවම බලය පාවිච්චි කරමින් මෙම පැමිණිලිකරුව පාලනය කර ගත් බවත්ය.

**නිරීක්ෂණ :**

පැමිණිලිකරු තම පැමිණිල්ල මගින් ප්‍රකාශ කර සිටින්නේ තමා, බිරිඳ සහ දරුවා සමඟ පාරේ ගමන් කරමින් සිටියදී වගඋත්තරකරුවන් විසින් තමාව අත්අඩංගුවට ගෙන පොලිස් ජීප් රථයට දමාගෙන පහරදීමක් සිදුකල බවත්, එමගින් තම අයිතිවාසිකම් උල්ලංඝනය වූ බවත්ය.

වගඋත්තර පාර්ශවය සිය කරුණු දක්වමින් සඳහන් කර සිටින්නේ, මෙම පැමිණිලිකරු බීමත්ව කළහකාරී ලෙස හැසිරෙමින් පහරදෙන බවට ඔහුගේ මව විසින් පොලිස් ස්ථානය වෙත කරන ලද පැමිණිල්ලක් අනුව මෙම පැමිණිලිකරුව අත්අඩංගුවට ගන්නා ලද බවත්, පහරදීමක් සිදු නොවූ බවත්, පැමිණිලිකරු බීමත්ව කළහකාරී ලෙස හැසිරීම හේතුවෙන් ඔහුව පාලනය කිරීම සඳහා අවම බලය පාවිච්චි කළ බවත්ය.

මෙම පැමිණිලිකරුගේ මව වන ජී.ගුණවතී යන අය 2018.10.15 වන දින පොලිස් ස්ථානය වෙත පැමිණ තම පුතා කරදර සිදුකරන බවට වාචිකව දන්වා ඇති බවත්, එම කරදර කිරීම පිළිබඳව සොයා බැලීම සඳහා වගඋත්තර පාර්ශවය විසින් විමර්ශනයක් ආරම්භ කර ආර්.විමලසිරි යන මෙම පැමිණිලිකරුව අත්අඩංගුවට ගෙන ඇති අතර, එසේ අත්අඩංගුවට ගෙන වසර දෙකකට පසුව ජී.ගුණවතී යන අයගේ පැමිණිල්ල 2020.07.24 වන දින සටහන් කර ඇත.

බීමත්ව කළහකාරී ලෙස හැසිරෙමින් තම මවට සිදුකරන ලද කරදර සම්බන්ධයෙන් 2018.10.15 වන දින පැමිණිලිකරුව අත්අඩංගුවට ගෙන තිබුණ ද, වැටලීම් භාර පො.සැ. 23339 නිලධාරියා විසින් 2019.01.18 දින අත්අඩංගුවට ගැනීමේ සටහන් යොදා ඇත.

2018.10.15 වන දින පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමෙන් පසුව බීමත්භාවය පරීක්ෂා කිරීම සඳහා අධිකරණ වෛද්‍ය පෝරම 270/18 යටතේ වැලිකන්ද රෝහලට යොමු කර ඇති අතර, ඒ අනුව අධිකරණ වෛද්‍යවරයා විසින් රෝගිය පරීක්ෂා කර ඇත.

පැමිණිලිකරු රෝහල්ගතව සිටියදී 2018.10.16 දින වැලිකන්ද පොලිස් ස්ථානයේ කොස්තාපල්වරයෙක් විසින් පැමිණිලිකරුගෙන් ප්‍රකාශ සටහන් කරගෙන ඇති අතර, වැටලීමට සහභාගි වූ සිවිල් ආරක්ෂක භට නිලධාරියාගේ ඇඟිල්ල සපා කා තුවාල සිදුකිරීම සම්බන්ධයෙන් අංක B/1681/2018 යටතේ 2018.10.16 දින අධිකරණය වෙත කරුණු වාර්තා කර ඇත.

මෙම පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීමට යාමේදී සිවිල් ආරක්ෂක භට නිලධාරියාට සිදුවූ තුවාල සම්බන්ධයෙන් එම නිලධාරියාව ද අධිකරණ වෛද්‍ය පෝරම අංක 271/18 යටතේ වැලිකන්ද රෝහල වෙත යොමු කර ඇත.

වගඋත්තර පාර්ශවය විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති උද්ධෘත සහිත වාර්තාව සහ ප්‍රකාශ සම්බධයෙන් සලකා බැලීමේදී මෙම පැමිණිලිකරුගේ මව වන ජී.ගුණවතී යන අය විසින් පැමිණිලිකරුට එරෙහිව වැලිකන්ද පොලිසිය වෙත වාචිකව පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය වේ.

ඒ සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා සහභාගී වී ඇති වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීමට කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ.

මෙම පැමිණිලිකරුව අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී බීමත්ව සිට ඇති බවට තොරතුරු අනාවරණය වීම මත ඔහුගේ බීමත්භාවය පරීක්ෂා කිරීම සඳහා රෝහල වෙත යොමු කර ඇති අතර, වෛද්‍යවරයා විසින් රෝගියා පරීක්ෂා කරන අවස්ථාවේදී මත්පැන් ගඳ වහනය වන බවට තොරතුරු සටහන් කර ඇති බව නිරීක්ෂණය වේ. එමෙන්ම, පැමිණිලිකරු රෝහල් ගතවී සිටියදී පොලිසිය වෙත ලබාදී ඇති ප්‍රකාශයෙන් ද ඔහු බීමත්ව සිටි බවට පිළිගෙන ඇති බව නිරීක්ෂණය වේ.

මෙම පැමිණිලිකරු අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී සිවිල් ආරක්ෂක භට නිලධාරියාගේ අත සපා කන ලද බවට ඔහු විසින් රෝහල වෙත ලබාදෙන ලද ප්‍රකාශය අනුව නිරීක්ෂනය වන අතර, සිවිල් ආරක්ෂක භට නිලධාරියාගේ අධිකරණ වෛද්‍ය පෝරමයේ වෛද්‍යවරයාගේ මතය අනුව ඔහුට තුවාල සිදුවී ඇති බව නිරීක්ෂණය වේ.

ඒ අනුව සමස්තයක් ලෙස සියළුම කරුණු සලකා බැලීමේදී වගඋත්තරකරුවන් වෙත පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීමට ප්‍රමාණවත් කරුණු පැවත තිබූ හෙයින් අත්අඩංගුවට ගෙන ඇති අතර, වගඋත්තරකරුවන්ගේ එම ක්‍රියාව හේතුවෙන් පැමිණිලිකරුගේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) ව්‍යවස්ථාවෙහි සඳහන් නීතියෙන් නියම කරන ලද කාර්ය පටිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු අත්අඩංගුවට ගැනීම සිදුනොකල යුත්තේය යන අයිතිවාසිකම උල්ලංඝනය වී නොමැති බව නිරීක්ෂණය වේ.

කෙසේ වෙතත් පැමිණිලිකරුගේ අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් වගඋත්තරකරුවන් විසින් යොදා ඇති උද්ධෘත සලකා බැලීමේදී පැමිණිලිකරුගේ මවගේ පැමිණිල්ල අවශ්‍ය අවස්ථාවේදී සටහන්වී නොතිබීමත්, වැටලීම් භාර සැරයන්වරයාගේ වැටලීම් සටහන් හා පැමිණිලිකරුගේ අත්අඩංගුවට ගැනීමේ සටහන් යොදා නොතිබීමත්, එම සටහන් කලකට පසු සටහන් කර තිබීමත් තුළින් වගඋත්තරකාර පො.සැ. 23339 නිලධාරියා විසින් තම රාජකාරිය නිසි අයුරින් ඉටු නොකර නොසැලකිලිමත්භාවයෙන් යුතුව කටයුතු කර ඇති බව ද නිරීක්ෂණය වේ.

පැමිණිලිකරුගේ කළහකාරි හැසිරීම පිළිබඳ සොයා බැලීම සඳහා ජී.ගුණවතී යන අයගේ වාචික ප්‍රකාශය මත විමර්ශනය සිදුකිරීම සිදුවිය හැකි බැවින්, ඇයගේ පැමිණිල්ල සටහන්ව නොතිබීම දෝෂ සහිත නොවේ. නමුත්, අපරාධ නඩු විධාන සංග්‍රහයේ 109 (1) යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව වගඋත්තරකරුවන්ට එය එසේ සිදුකල හැකිව තිබුණද, වගඋත්තරකරුවන් ඔවුන්ගේ තොරතුරු සටහන් පොත් වල එය සටහන් කර නොමැති අතර, එමගින් ඔවුන් රාජකාරිය පැහැර හැරීමක් සිදුකර ඇති බව නිරීක්ෂණය වේ.

කෙසේ වෙතත්, වැලිකන්ද පොලිස් ස්ථානාධිපතිවරයා විසින් මෙම පැමිණිලිකරුගේ ක්‍රියාව හා ඔහුගේ මවගේ වාචික පැමිණිල්ල පිළිබඳව නිසි ක්‍රමවේදය අනුගමනය කිරීමට වැටලීම් භාරව කටයුතු කල නිලධාරින්ට නිවැරදි මඟපෙන්වීමක් සිදුකර නොමැති බවද නිරීක්ෂණය වන අතර, නිවැරදි මඟපෙන්වීම හෝ අධීක්ෂණය තුළ තිබූ අඩුපාඩුව හේතුවෙන් වැටලීම් භාර නිලධාරියාගේ වැටලීම් සටහන් සහ පැමිණිලිකරුගේ අත්අඩංගුවට ගැනීමේ සටහන්, පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන වසරක් ගෙවී ගිය පසු සිදුව ඇති බව ද පෙනීයයි.

පැමිණිලිකරු කොමිෂන් සභාව වෙත දන්වා ඇත්තේ, ඔහුගේ බිරිඳ සමඟ වෙනත් නිවසකට යමින් සිටියදී එනම්, පාරේදී ඔහුව අත්අඩංගුවට ගෙන බලහත්කාරයෙන් ජීප් රථයට නංවාගෙන ඔහුට පහරදී වධහිංසාවක් සිදුකල බවය. එමෙන්ම, තමාට පහරදීම සිදුකලේ පො.කො. 74585 එච්.ඩී.ජී.එස්.හේවගේ සහ සිවිල් ආරක්ෂක භට නිලධාරි එම් 029113 වානක යන වගඋත්තරකරුවන් බව කියාසිටි.

නමුත්, වගඋත්තරකරුවන් විසින් පහරදීමේ චෝදනාව ප්‍රතික්ෂේප කර ඇති බව නිරීක්ෂණය වේ. පැමිණිලිකරුට අදාළ අධිකරණ වෛද්‍ය වාර්තාව පොළොන්නරුව මහ රෝහල වෙතින් කැඳවා ඇති අතර, එහි පහත පරිදි වෛද්‍ය මතය සටහන් කර ඇත.

1. a contusion 2cm on left per orbital region of the face. It was associated with sub conjunctiva haemorrhage.

2 left sided tympanic membrane central perforation.

මෙම පැමිණිලිකරුව වෛද්‍යවරයා වෙත යොමු කිරීමෙන් පසුව ඔහු විසින් වෛද්‍යවරයා වෙත ලබාදී ඇති ප්‍රකාශය මඟින් පොලිස් නිලධාරියෙකු හා සිවිල් ආරක්ෂක නිලධාරියෙකු විසින් ජීප් රථයේ දී ඔහුගේ මුහුණට හා වම් කණට කිහිප අවස්ථාවක් අතින් පහරදුන් බව ප්‍රකාශ කර ඇත. තුවාල සිදුවී ඇති අයුරු සම්බන්ධයෙන් වෛද්‍යවරයාගේ මතය සටහන් කර ඇති අතර, එහිදී පහරදීම හේතුවෙන් පැමිණිලිකරුගේ වම් කනෙහි ඇසීමේ දුර්වලතාවයක් සිදුව ඇති බවට මතය ලබාදී ඇත. 'The Conductive hearing loss part of the left sided mixed hearing lost is most likely due to assault'

මෙම පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීමෙන් පසුව ඔහුගේ බීමත්බව පරීක්ෂා කිරීම සඳහා අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පෝරම අංක 290/18 යටතේ වැලිකන්ද රෝහල වෙත ඉදිරිපත් කර ඇති අතර, වෛද්‍යවරයා විසින් අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පෝරමයේ අංක 10 යටතේ තුවාල යන්නට තාඩිත ලෙස ද මතය සටහන් කර ඇත.

වගඋත්තර පාර්ශවය කියාසිටින්නේ, මෙම පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමට කටයුතු කිරීමේදී ඔහු බීමත්ව සිටි බැවින්, අත්අඩංගුවට ගැනීමට විරෝධය පල කරමින් පොලිස් නිලධාරින් සමඟ පොරබඳන ලද බවත්, එහිදී මොහුව මෙල්ල කර ගැනීම සඳහා අවම බලය පාවිච්චි කල බවත්, මෙම අවස්ථාවේදී මෙම පැමිණිලිකරු විසින් සිවිල් ආරක්ෂක භට නිලධාරියාගේ අත සපා කන ලද බවත්, මෙම සිවිල් ආරක්ෂක භට නිලධාරියා ද රෝහල් ගතව ප්‍රතිකාර ලබාගත් බවත්ය.

සිවිල් ආරක්ෂක භට නිලධාරියාගේ අංක 291/18 දරණ අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පෝරමය අනුව 10 තුවාලය යටතේ අපවර්ථන ලෙස වෛද්‍යවරයාගේ මතය ලබාදී ඇත.

පැමිණිලිකරු විසින් රෝහලේ දී ලබාදී ඇති ප්‍රකාශය මඟින් ප්‍රකාශ කර ඇත්තේ, ග්‍රාමාරක්ෂක භට නිලධාරියා ගහන විට ග්‍රාමරක්ෂකගේ ඇඟිල්ල මම හැපුවා යනුවෙනි. ඒ අනුව, වගඋත්තරකරුවන්ගේ ප්‍රකාශ හා දෙපාර්ශවය සම්බන්ධයෙන් කොමිෂම වෙත ඉදිරිපත් වී ඇති වෛද්‍ය වාර්තා සලකා බැලීමේදී දෙපාර්ශවයටම තුවාල සිදුවී ඇති බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරුගේ ශරීරයේ පවතින තුවාල ඔහුගේම ක්‍රියාකලාපය නිසා සිදුවූවක් බව 03 හා 04 වගඋත්තර පාර්ශවය විසින් කරුණු ඉදිරිපත් කළ ද, පැමිණිලිකරු විසින් වෛද්‍යවරයා වෙත ලබාදී ඇති කෙටි ඉතිහාසය හා වෛද්‍යවරයාගේ මතය අනුව පැමිණිලිකරුගේ වම් කනෙහි පවතින රෝගී තත්ත්වය පැමිණිලිකරුගේ ක්‍රියාවක් හේතුවෙන් සිදුව ඇති තුවාල බවට වගඋත්තරකරුවන් විසින් කරනු ලබන කරුණු දැක්වීම ප්‍රතික්ෂේප කිරීමට සිදුවේ. දෙපාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති සියළු කරුණු සලකා බැලීමේදී පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීමෙන් පසුව පැමිණිලිකරු පොලිස් ආරක්ෂාව භාරයේ සිටියදී 03 සහ 04 වගඋත්තරකරුවන්ගේ ක්‍රියාවක් හේතුවෙන් පැමිණිලිකරු සම්බන්ධව 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාවෙහි සඳහන් කිසිම තැනැත්තෙකු වධහිංසාවට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය යන අයිතිවාසිකම පැමිණිලිකරු සම්බන්ධයෙන් උල්ලංඝනය වී ඇති බව නිගමනය කරමි.

තවද, මෙම පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සඳහා වැටලීම් භාරව කටයුතු කල පො.සැ. 23339 ආරියරත්න නිලධාරියා ද මෙම අවස්ථාවේදී අදාළ ජීප් රථයේ සිට ඇති අතර, වැටලීම් භාර නිලධාරියා ලෙස මෙම පැමිණිලිකරුගේ ආරක්ෂාව, අත්අඩංගුවට ගැනීම හා සටහන් යෙදීම ඇතුළු රාජකාරි සම්බන්ධයෙන් නොසැලකිලිමත් ලෙස කටයුතු කර ඇති බව ඔහුගේ සම්පූර්ණ වැටලීම් සටහන් හා කොමිෂන් සභාව වෙත ලබා දී ඇති ප්‍රකාශ මඟින් නිරීක්ෂණය වේ.

**නිර්දේශය :**

1. ඒ අනුව ඉහත කරුණු සියල්ල සලකා බැලීමේදී පැමිණිලිකරුගේ 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 11 වන ව්‍යවස්ථාව මඟින් සුරක්ෂිත කර ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම වගඋත්තර පාර්ශවය විසින් කඩ කර ඇති බැවින්, පැමිණිලි පාර්ශවය වෙත 03 සහ 04 වන වගඋත්තරකරුවන් විසින් රු. 10,000/- ක මුදලක් ගෙවීමට කටයුතු කළ යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2. එසේම, 02 වගඋත්තරකරු තම රාජකාරිය නිසි ලෙස ඉටු නොකිරීම පිළිබඳව ආයතන මට්ටමින් පරීක්ෂණයක් පවත්වා ඉදිරි පියවර ගැනීම සඳහා මෙහි පිටපතක් පොලිස්පතිවරයා වෙත ද යොමු කරනු ලැබේ.

2022.02 .21 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම්, පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ම.හේ.නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lank

පිටපත : 01. පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ.

02. මානව හිමිකම් කොමිෂන් සභා ප්‍රාදේශීය කාර්යාලය,
අනුරාධපුරය.

සැ.යු. : අදාළ මුදල "මුදල් ඇණවුමක්" මඟින් පැමිණිලි පාර්ශවය වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාව වෙත ලැබීමට සැලැස්විය යුතුය.

ස/-